# (ආ) දේශීය කෘෂිකර්මය

### 1. ඉඩම් ප්‍රතිසංස්කරණය

පුද්ගලයින් සතුව පැවති අක්කර පනහට වැඩි කෘෂිකාර්මික ඉඩම් (කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් සීමාව අක්කර විසිපහක්) 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට පැවරුනු ලෙසට සැලකුණි. කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයාගෙන් ලබා ගත් විශේෂ අනුමැතියක් නොමැති නම් එලෙස ව්‍යවස්ථානුකූලව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට පැවරුනු ඉඩම් අවුරුදු දෙකක උපරිම කාලසීමාවකදී (1974 අගෝස්තු 26 වන විට) බෙදදිය යුතුවිය. 1974 අගෝස්තු 26 දින වන විට එසේ පළමු ඉඩම් හිමිකරුවන්ගෙන් පැවරුනු සියලුම ඉඩම් නොයෙකුත් සංවිධාන හෝ පුද්ගලයින්ට බෙදා දෙන ලදී.

1972 ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙතට පවරා ගත් මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 5,59,377 කි. කොමිසම වෙතට පැවරුනු එම ඉඩම් වගා හෝ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව වර්ග කිරීමක් II (ආ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

II (ආ) 1 වැනි සංඛ්‍යා සටහන

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙත පවරා ගත් ඉඩම් උපයෝගිතාව අනුව වර්ග කිරීම

| ඉඩම් උපයෝගී වී ඇති අන්දම | අක්කර | පවරා ගත් මුළු ඉඩම් වල ප්‍රතිශතය |
|---|---|---|
| කැලෑ, පතන බිම් සහ වගා නොකරන ලද .. | 1,82,257 | 32·6 |
| තේ .. .. .. | 1,35,760 | 24·3 |
| පොල් .. .. .. | 1,15,350 | 20·6 |
| රබර් .. .. .. | 82,944 | 14·8 |
| වී .. .. .. | 16,270 | 2·9 |
| මිශ්‍ර භෝග .. .. .. | 14,513 | 2 6 |
| කරදමුංගු (එන්සාල්) .. .. .. | 7,699 | 1·4 |
| හේන් .. .. .. | 1,861 | 0·3 |
| අත්හරින ලද තේ සහ රබර් .. .. | 1,701 | 0·3 |
| කුරුඳු .. .. .. | 777 | 0·1 |
| කොකෝවා .. .. .. | 245 | 0·1 |
| එකතුව .. .. | 5,59,377 | 100·0 |

මූලය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම.

මෙම සංඛ්‍යා සටහනින් දක්වෙන පරිදි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙත පවරා ගත් ඉඩම් ප්‍රමාණයෙන් තුනෙන් එකක් පමණ වගා නොකරන ලද ඉඩම් ය. පවරා ගන්නා ලද මුළු ඉඩම් ප්‍රමාණයෙන් හතරෙන් එකක් පමණ තේ ඉඩම් වන අතර, එය තේ වගා කරන ලද මුළු ඉඩම් ප්‍රමාණයෙන් පහෙන් එකකට වැඩිය. පොල් ඉඩම් ප්‍රමාණය පවරා ගත් මුළු ඉඩම් ප්‍රමාණයෙන් පහෙන් එකක් පමණ වන අතර එය පොල් වගාව යටතේ ඇති මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට දහයක් පමණ විය. පවරා ගත් රබර් ඉඩම් ප්‍රමාණය, පවරා ගත් මුළු ඉඩම් ප්‍රමාණයෙන් සහ රබර් වගාව යටතේ ඇති මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට පහළොවක් පමණ වේ. පැවරී ඇති කරදමුංගු වගා කරන ලද බිම් ප්‍රමාණය ඉතා සුළු වුවද එය ලංකාවේ කරදමුංගු වගා කොට ඇති මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 70 ක් තරම් ප්‍රමාණයක් වේ.

ආයතන හෝ කළමණාකාරී ඒකක වශයෙන් නැවත බෙදා හරින ලද මෙම ඉඩම් II (ආ) 2 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ. කෙසේ වුවද, බෙදා හරින ලද එම ඉඩම් බෙදා දීමට යටත් වූ විධිවිධාන හා කොන්දේසිවලට අනුකූලව ප්‍රයෝජනයට නොගැනෙන්නේ නම් එසේ බෙදා හරින ලද ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙත නැවත පවරා ගැනීමට පුළුවන. (ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය 24 (2) ඡේදය) එසේම යම් යම් සංවිධානවලට දෙන ලද ඉඩම් පසුව වෙනත් සංවිධානවලට පවරා දීමටද පුළුවන. එමනිසා II (ආ) 2 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වෙන සංඛ්‍යා අවශ්‍යයෙන්ම අවසාන තත්ත්වය නොවන අතර එය මෙම ඉඩම් වල කළමනාකරණ විධි වල නියම අවසාන තත්ත්වයද නොදක්වයි.

### II (ආ) 2 වැනි සංඛ්‍යා සටහන

### බෙදා හරින ලද ප්‍රතිසංස්කරණයට භාජනය වූ ඉඩම් පවරා දීමේ ක්‍රමය අනුව වර්ග කිරීම

| ආයතනය හෝ කළමනාකරණ ක්‍රමය | භූමි ප්‍රමාණය අක්කර | පවරා ගත්මුළු ප්‍රමාණයේ ප්‍රතිශතය |
|---|---|---|
| ප්‍රාදේශීය ඉඩම් ප්‍රතිසංස්කරණ බලධාරීන් .. | 1,77,719 | 31·77 |
| ඉඩම් කොමසාරිස් .. | 1,11,375 | 19·91 |
| උඩරට සමුපකාර වතු සංවර්ධන මණ්ඩලය (උසවසම) .. | 87,235 | 15·60 |
| විවිධ සේවා සමුපකාර සමිති .. | 48,143 | 8·61 |
| සමුපකාර ජනාවාස .. | 38,704 | 6·92 |
| රාජ්‍ය වැවිලි සංස්ථාව .. | 31,791 | 5·68 |
| විශේෂ සමුපකාර සංවිධාන .. | 19,750 | 3·53 |
| ගම්වාසීනට .. | 13,833 | 2·47 |
| දිසාපතිවරු .. | 6,450 | 1·15 |
| සත්ව පාලන සංවර්ධන මණ්ඩලය .. | 4,891 | 0·87 |
| තේ, පොල් සහ රබර් පර්යේෂණ ආයතන .. | 2,184 | 0·39 |
| පොල් වගා කිරීමේ මණ්ඩලය .. | 1,235 | 0·22 |
| වන සංරක්ෂණය .. | 785 | 0·14 |
| දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපාර .. | 754 | 0·14 |
| අනෙකුත් .. | 14,528 | 2·60 |
| එකතුව .. | 5,59,377 | 100·00 |

මූලය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම

## 2. කෘෂිකාර්මික නිෂ්පාදන

### (අ) 1974 වී නිෂ්පාදනය

පසුගිය වර්ෂය සමඟ සසඳන කල 1974 වී නිෂ්පාදනයේ තියුණු ඉහළ නැඟීමක් ඇති බව ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සංඛ්‍යා ලේඛන වලින් දක්වේ. ඒ අනුව 1973 දී බුසල් 629 ලක්ෂයක් වූ වී නිෂ්පාදනය, 1974 දී බුසල් 768 ලක්ෂය දක්වා වැඩි වී ඇත. එය සියයට 22 ක වැඩිවීමකි.

ප්‍රධාන වශයෙන් මෙම වැඩිවීම ලබා ගෙන ඇත්තේ වගා කරන ලද බිම් ප්‍රමාණය වැඩි කිරීමෙනි. 1973 වර්ෂයට වඩා 1974 වර්ෂයේදී වී වගාව යටතේ වූ බිම් ප්‍රමාණය (අස්වැන්න නෙලා ගත් ශුද්ධ ප්‍රමාණය) සියයට 19 ක තරම් ප්‍රමාණයකින් වැඩි විය. වර්ෂය තුළ සිදු වූ අස්වැන්න පාළු වීමේ ප්‍රමාණය ඉතාමත් අඩුවීම අස්වැන්න ලබා ගත් ශුද්ධ බිම් ප්‍රමාණය වැඩිවීමට කොටස් වශයෙන් හේතු විය. වර්ෂය තුළ වපුරන ලද බිම් ප්‍රමාණයෙන් අස්වැන්න නෙලා ගත නොහැකි වූයේ සියයට 3·85 ක ප්‍රමාණයක පමණි. 1974 දී අක්කරයකට අස්වැන්න වැඩිවීම සාපේක්ෂ වශයෙන් සුළුය. එය අක්කරයකට බුසල් 1·08 ක් හෝ 1973 ට වඩා සියයට 2·42 කි. දත්ත තිබෙන දිස්ත්‍රික්කයන් ගැන සලකා බැලීමේදී එම සෑම දිස්ත්‍රික්කයකම දියුණු කළ වී වර්ග යටතේ වගා කරන ලද බිම් ප්‍රමාණය වැඩි වී ඇති බව පෙනේ.

1974 දී ගොවීන් වෙත ලබා දුන් පොහොර ප්‍රමාණය හා ණය ප්‍රමාණය යන දෙකෙහිම සැලකිය යුතු වැඩිවීමක් විය. පොහොර නිකුත් කිරීම 1972/73 දී ටොන් 96,816 සිට 1973/74 දී ටොන් 1,15,702 දක්වා වැඩිවිය. 1972/73 දී වී වගාව සඳහා නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ දෙන ලද ණය මුදල් ප්‍රමාණය රුපියල් 283 ලක්ෂයක් වූ අතර, එය 1973/74 දී රුපියල් 1090 ලක්ෂය දක්වා වැඩිවිය. එය දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 285 ක් පමණ වේ. වී නිෂ්පාදන වියදම වැඩිවීම සහ ණය ආපසු ගෙවීම් පැහැර හැරිය වුනට ණය නොදීම පිළිබඳවූ තීරණයන් ඉවත්කිරීම මෙම වැඩිවීමට හේතු විය. 1973/74 වර්ෂයේදී දෙන ලද මුළු ණය ප්‍රමාණය වී වගාව සඳහා මෙතෙක් ලබා දුන් වැඩිම ප්‍රමාණය වෙයි.

1974 ලබාගත් මුළු වී නිෂ්පාදනය 1970 න් පසු ලබා ගත් වැඩිම නිෂ්පාදන ප්‍රමාණය වේ. එය 1970 වාර්තාගත නිෂ්පාදනයට වඩා සුළු වශයෙන් අඩුය. 1970 වගා කන්නවල අක්කරයක එලදාවට වඩා 1974 වර්ෂයේ අක්කරයක එලදාව සැලකිය යුතු ලෙස අඩුය. 1969/70 මහ සහ 1970 යල කන්න වලදී අක්කරයක එලදාව පිළිවෙලින් බුසල් 52·21 ක් සහ 44·59 ක් වූ අතර, 1973/74 මහ සහ 1974 යල කන්න වලදී අක්කරයක එලදාව පිළිවෙලින් බුසල් 47·72 සහ 41·74 ක් විය. වෙනත් වචන වලින් කියතොත් 1974 නිෂ්පාදනය 1970 නිෂ්පාදන මට්ටමට ආසන්න වී ඇත්තේ වගා කරන ලද බිම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩිවීම නිසා ය.

පහත දැක්වෙන කොටස්වලින් 1973/74 මහ සහ 1974 යල කන්නයන් සඳහා වී අංශයෙහි ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කොට ඇත. මෙම කන්න දෙක පිළිබඳ දත්තයන් II (ආ) 3 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**1973/74 මහ කන්නය**

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සංඛ්‍යා ලේඛනයන්ට අනුව 1973/74 මහ කන්නයේ මුළු වී නිෂ්පාදනය බුසල් 526 ලක්ෂයක් විය. මෙය 1972/73 මහ කන්නයේ නිෂ්පාදනයට වඩා සියයට 25 කින් වැඩිවී ඇති අතර, මහ කන්නයකදී ලබා ගත් වැඩිම අස්වැන්නද මෙය වේ. මෙම වැඩිවීම ළඟා කර ගෙන ඇත්තේ, වගා කරන ලද බිම් ප්‍රමාණය වැඩිවීමත්, අක්කරයකින් ලබාගත් එල්දාව වැඩිවීමත් නිසාය.

1972/73 මහ කන්නයේදී වපුරන ලද දළ අක්කර ප්‍රමාණය 11·8 ලක්ෂයක් වූ අතර, 1973/74 මහ කන්නයේදී එය අක්කර 13·2 ලක්ෂය දක්වා වැඩිවූ අතර, අස්වැන්න නෙලා ගත් දළ අක්කර ගණන ද පිළිවෙලින් අක්කර 10·9 ලක්ෂයේ සිට 12·9 ලක්ෂය දක්වා වැඩිවිය. අස්වැන්න නෙලා නොගත් බිම් ප්‍රමාණය අක්කර 29,476 ක් හෙවත් වපුරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 2·24 කි. මෙයින් වගා පාලුව සිදුවී ඇත්තේ ඉතාමත් සුළු වශයෙන් බව පෙන්වයි.

1972/73 මහ කන්නයේදී අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ අක්කරයක සාමාන්‍ය එලදාවද බුසල් 45·54 සිට 1973/74 මහ කන්නයේදී බුසල් 47·7 දක්වා වැඩිවී ඇත. මහ කන්නයේ වගාව සඳහා පාවිච්චි කරන ලද යෙදවුම්වල ප්‍රමාණයද සැලකිය යුතු අන්දමින් වැඩිවී ඇත. වී වගාව සඳහා නව කෘෂි කාර්මික ණය ක්‍රමය යටතේ දෙන ලද ණය මුදල් ප්‍රමාණයේ වැඩිවීම තුන් ගුණයකටත් වඩා වැඩිවිය. එය 1972/73 මහ කන්නයේදී රුපියල් 203 ලක්ෂයක් වූ අතර, 1973/74 මහ කන්නයේදී රුපියල් 842 ලක්ෂයක් දක්වා වැඩිවී ඇත. පොහොර නිකුත් කිරීම පෙර මහ කන්නයට වඩා ටොන් 22,995 කින් හෙවත් සියයට 41 කින් වැඩිවී ඇත. පෙර මහ කන්නයේ අස්වැන්න නෙලා ගන්නා ලද කුඹුරු අක්කරයක් සඳහා නිකුත් කළ පොහොර ප්‍රමාණය වූ රාත්තල් 115·8 සමඟ සසඳන කල, 1973/74 මහ කන්නයේදී නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය වූයේ රාත්තල් 137·5 කි. අසම්පූර්ණ දත්තයන්ට අනුව දියුණු කරන ලද වී වර්ග යටතේ වගා කොට ඇති කුඹුරු අක්කර ප්‍රමාණය වැඩිවී ඇති බව පෙනේ.

## II (ආ) 3 වැනි සංඛ්‍යා සටහන

### 1973/74 වගා වර්ෂයෙහි (අ) දිස්ත්‍රික්ක අනුව ක්‍රියාකාරිත්වය — වී අංශය (ආ)

| කලාප සහ දිස්ත්‍රික්ක | වැපුරූ ප්‍රමාණය (අක්කර) | | අස්වැන්න නෙලා ගත් ශුද්ධ ප්‍රමාණය (අක්කර) | | නිෂ්පාදනය (බුසල් '000) | | අක්කරයක ඵලදාව (බුසල්) | | දියුණු කළ වර්ග යටතේ වූ බිම් ප්‍රමාණය (අක්කර) | | පොහොර නිකුතුව (ටොන්) | | ස. මි. ක්‍ර. යටතේ මිලට ගැනීම (බුසල් '000) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මහ 1973/74 | යල 1974 | මහ 1973/74 | යල 1974 | මහ 1973/74 | යල 1974 | මහ 1973/74 | යල 1974 | මහ 1973/74 | යල 1974 | මහ 1973/74 | යල 1974 | මහ 1973/74 | යල 1974 |
| තෙත් කලාපය | 384,014 | 336,959 | 325,167 | 274,523 | 15,306 | 10,689 | 47·07 | 38·94 | 253,671 | 190,231 | 23,800 | 16,417 | 1993·8 | 1108·7 |
| කොළඹ .. | 60,604 | 54,430 | 51,256 | 43,426 | 2,058 | 1,527 | 40·15 | 35·17 | 46,254 | 39,416 | 4,955 | 3,049 | 21·5 | 7·9 |
| කළුතර .. | 50,932 | 47,226 | 43,556 | 37,155 | 1,445 | 1,088 | 33·17 | 29·28 | 19,008 | 12,295 | 2,477 | 2,715 | 34·9 | 8·6 |
| ගාල්ල .. | 57,424 | 54,610 | 49,386 | 44,000 | 1,626 | 1,263 | 32·93 | 28·70 | 18,969 | 15,409 | 3,706 | 1,802 | 93·7 | 49·0 |
| මාතර .. | 48,106 | 47,287 | 40,808 | 37,825 | 1,669 | 1,312 | 40·90 | 34·68 | 31,000 | 33,241 | 3,511 | 2,322 | 170·1 | 61·8 |
| කෑගල්ල .. | 27,466 | 26,825 | 23,019 | 22,182 | 1,250 | 871 | 54·31 | 39·25 | 23,246 | 26,605 | 2,190 | 1,193 | 52·1 | 39·5 |
| රත්නපුර .. | 37,061 | 35,227 | 31,261 | 29,623 | 1,251 | 1,160 | 40·02 | 39·15 | 22,485 | 14,969 | 1,805 | 2,188 | 623·0* | 366·6* |
| මහනුවර .. | 48,424 | 44,352 | 40,639 | 37,586 | 2,527 | 2,279 | 62·19 | 60·65 | 41,791 | 30,717 | 3,306 | 2,353 | 546·0 | 387·4 |
| නුවරඑළිය .. | 18,107 | 12,512 | 15,318 | 10,494 | 1,484 | 674 | 96·85 | 64·24 | 17,521 | 8,956 | 684 | 459 | 49·3 | 9·4 |
| බදුල්ල .. | 35,890 | 14,490 | 29,924 | 12,232 | 1,996 | 515 | 66·69 | 42·08 | 33,397 | 8,623 | 1,166 | 336 | 493·2 | 178·5 |
| වියළි කලාපය | 933,824 | 383,280 | 777,703 | 304,428 | 37,326 | 13,477 | 48·00 | 44·27 | ලැ. නො | ලැ. නො | 55,275 | 20,210 | 13198·6 | 4563·8 |
| පුත්තලම .. | 34,007 | 11,015 | 26,299 | 8,330 | 847 | 265 | 32·21 | 31·77 | 24,440 | 10,493 | 1,420 | 346 | 132·3 | 68·2 |
| කුරුණෑගල .. | 143,582 | 112,973 | 120,215 | 90,535 | 4,672 | 3,636 | 38·86 | 40·16 | 92,903 | 104,123 | 9,409 | 5,485 | 585·5 | 532·8 |
| මාතලේ .. | 28,163 | 16,116 | 23,432 | 13,457 | 1,145 | 573 | 48·88 | 42·60 | 25,141 | 11,094 | 1,662 | 392 | 351·5 | 103·7 |
| මොණරාගල .. | 21,656 | 4,568 | 18,119 | 3,798 | 1,072 | 160 | 59·15 | 42·02 | 18,982 | ලැ. නො | 999 | 236 | 379·4* | 84·1* |
| යාපනය .. | 86,735 | 11,425 | 69,803 | 9,684 | 2,634 | 427 | 37·74 | 44·12 | 62,932 | ලැ. නො. | 6,834 | 1,432 | 312·5 | 19·5 |
| වවුනියාව .. | 55,860 | 4,187 | 45,350 | 3,547 | 1,839 | 184 | 40·55 | 51·89 | 53,174 | 4,032 | 3,566 | 161 | 669·0 | 40·7 |
| මන්නාරම .. | 47,222 | 4,334 | 40,707 | 1,210 | 2,278 | 40 | 55·95 | 32·79 | 44,645 | 3,184 | 3,214 | 181 | 765·2 | 20·8 |
| අනුරාධපුරය .. | 134,805 | 30,811 | 113,470 | 24,566 | 5,713 | 1,016 | 50·35 | 41·38 | ලැ. නො. | ලැ. නො. | 4,906 | 974 | 1618·3 | 691·4 |
| පොළොන්නරුව .. | 70,264 | 43,572 | 58,776 | 36,694 | 4,836 | 1,805 | 82·28 | 49·19 | 58,783 | 37,368 | 5,511 | 3,035 | 3084·4 | 989·0 |
| ත්‍රිකුණාමලය .. | 57,126 | 10,933 | 48,286 | 9,095 | 2,080 | 493 | 43·08 | 54·25 | ලැ. නො. | ලැ. නො. | 3,005 | 399 | 1037·7 | 266·1 |
| මඩකලපුව .. | 91,141 | 25,648 | 76,801 | 17,852 | 3,065 | 724 | 39·91 | 40·55 | 85,808 | 15,416 | 5,614 | 1,122 | 861·7 | 78·9 |
| අම්පාර .. | 101,021 | 60,598 | 84,788 | 46,254 | 3,748 | 1,724 | 44·20 | 37·27 | 94,485 | ලැ. නො. | 5,103 | 4,657 | 1916·6 | 866·6 |
| හම්බන්තොට .. | 46,079 | 30,990 | 37,918 | 25,712 | 2,375 | 1,542 | 62·64 | 59·98 | 44,303 | 28,370 | 3,765 | 1,624 | 1484·5* | 802·0* |
| උඩ වලවේ .. | 16,163 | 16,110 | 13,739 | 13,694 | 1,022 | 888 | 74·42 | 64·83 | 13,607 | 13,508 | 267 | 166 | — | — |
| ශ්‍රී ලංකාව .. | 1,317,838 | 720,239 | 1,102,870 | 578,951 | 52,632 | 24,166 | 47·72 | 41·74 | ලැ. නො. | ලැ. නො. | 79,075 | 36,627 | 15192·4 | 5672·5 |

මූලයන්: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය සහ වී අලෙවි මණ්ඩලය.

ලැ. නො. – ලැබී නොමැත.

(අ) වගා වර්ෂය 1973/74 මහ (සැප්තැම්බර්/ඔක්තෝම්බර්—මාර්තු/අප්‍රියෙල්) සහ 1974 යල (අප්‍රියෙල්/මැයි—අගෝස්තු/සැප්තැම්බර්) යන කන්න වලින් යුක්ත වෙයි.

(ආ) තාවකාලික ඇස්තමේන්තු

* උඩ වලවේ ප්‍රදේශයෙන් මිලදී ගත් වී ඇතුළත් වේ.

## 1974 යල කන්නය

1974 යල කන්නයේ මුළු වී නිෂ්පාදනය බුසල් 242 ලක්ෂයක් බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සංඛ්‍යාලේඛනවලින් පෙනේ. මෙය 1973 යල කන්නයේ වී නිෂ්පාදනයට වඩා සියයට 15·6 ක වැඩිවීමකින් සමන්විත වන නමුදු, එය 1970 සහ 1971 යල කන්නයන්හි (පිළිවෙලින් බුසල් 280 ලක්ෂයක් සහ 253 ලක්ෂයක් වූ) නිෂ්පාදනය ඉක්මවා නොයයි.

1973 යල කන්නයට වඩා 1974 යල කන්නයේ වපුරන ලද දළ අක්කර ගණන සියයට 17·5 කින් වැඩිවීමත්, අස්වැන්න කපා ගත් දළ අක්කර ගණන සියයට 18·5 කින් වැඩිවීමත් 1974 යල කන්නයේදී නිෂ්පාදනය වැඩිවීමට බලපෑ සාධක විය. 1973 යල කන්නය සමග සසඳන කල 1974 යල කන්නයේ වැපුරූ බිම් ප්‍රමාණයේ හා අස්වැන්න කපා ගන්නා ලද බිම් ප්‍රමාණයේ වැඩිවීම අතර වෙනසේ සියයට ගණන් වලින් 1974 යල කන්නයේ ඉතාමත් අඩු වගා පාලුවක් සිදුවී ඇති බව දක්වයි. වපුරන ලද, එහෙත් අස්වැන්න නෙලා නොගත් ප්‍රමාණය වපුරන ලද මුළු අක්කර ගණනින් සියයට 5·43 කි. අසම්පූර්ණ දත්තයන් අනුව වැඩිදියුණු කරන ලද බීජ වර්ග යටතේ වගා කළ බිම් ප්‍රමාණය සියයට 46·7 කින් වැඩිවී ඇත. නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ දෙන ලද ණය ප්‍රමාණය 1973 යල කන්නයේ වූ රුපියල් 80 ලක්ෂයේ සිට 1974 යල කන්නයේදී රුපියල් 248 ලක්ෂය දක්වා වැඩිවිය. මෙය සියයට 210 ක වැඩිවීමකි. 1973 යල කන්නයේ නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය ටොන් 40,736 ක් වූ අතර, 1974 යල කන්නයේ නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය වූයේ ටොන් 36,627 කි. පෙර යල කන්නයේ අස්වැන්න කපා ගන්නා ලද කුඹුරු අක්කරයක් සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය වූ රාත්තල් 158 8 සමග සසඳන කල, 1974 යල කන්නයේදී එය රාත්තල් 119 9 කි.

### සහතික මිල ක්‍රමය යටතේ වී මිලදී ගැනීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සංඛ්‍යාලේඛනයන්ට අනුව සතුටුදයක වී නිෂ්පාදනයක් ඇති බව පෙනුනද, එයින් වී අලෙවි මණ්ඩලය විසින් සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගෙන ඇති ප්‍රමාණය බලාපොරොත්තුවූ ප්‍රමාණයට වඩා අඩුය. මිලදී ගැනීමේ ඒකාධිකාරී අයිතිවාසිකම් වී අලෙවි මණ්ඩලය සතුව පැවතීම සහ වී ප්‍රවාහනය කිරීම පිළිබඳ සැලකිය යුතු සීමාවන් පනවා තිබියදීත්, මණ්ඩලය විසින් මිලදී ගෙන ඇත්තේ 1974 නිෂ්පාදනයෙන් සියයට 27 ක් පමණි. මෙය පසුගිය වර්ෂයේ මුළු නිෂ්පාදනයෙන් මිලදී ගැනීම වූ සියයට 36 ටත් අඩු ප්‍රමාණයකි. වී අලෙවි මණ්ඩලය 1972 ජනවාරි මාසයේදී ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ වී මිලදී ගැනීමේ කටයුත්ත බාර ගත්තද, 1972 අප්‍රේල් මාසයේ වී අලෙවි මණ්ඩලය වගකීම තනිව බාර ගන්නා තෙක් මෙම ආයතන දෙකම වී මිලදී ගැනීම කර ගෙන යන ලදී. 1970/71 වර්ෂයේ සිට මුළු වී නිෂ්පාදනයෙන් මිලදී ගන්නා ලද අනුපාතිකයත්, මිලදී ගන්නා ලද ප්‍රමාණයත් යන දෙකම අඩුවී ඇත. මෙය II (ආ) 4 සංඛ්‍යා සටහනින් පෙන්වයි.

**II (ආ) 4 සංඛ්‍යා සටහන**

**සහතික මිල ක්‍රමය (ස. මි. ක්‍ර.) යටතේ වී මිලදී ගැනීම් හා නිෂ්පාදනය**

**1969/70 – 1973/74**

| වර්ෂය | මුළු වී නිෂ්පාදනය (බුසල් දහස් ගණනින්) | ස. මි. ක්‍ර. යටතේ මිලදී ගැනීම (බුසල් දහස් ගණනින්) | ස. මි. ක්‍ර. යටතේ මිලට ගත් ප්‍රමාණය මුළු නිෂ්පාදනයෙන් සියයට ගණනක් වශයෙන් |
|---|---|---|---|
| 1969/70 | 77,447·0 | 26,218·4 | 33·9 |
| 1970/71 | 66,895·0 | 32,376·5 | 48·4 |
| 1971/72 | 62,720·0 | 25,213·7 | 40·2 |
| 1972/73 | 62,900·0 | 22,892·1 | 36·4 |
| 1973/74 | 76,798·0 | 20,864·9 | 27·2 |

මූලයන්: කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය,
වී අලෙවි මණ්ඩලය.

1973 සහ 1974 මිලදී ගන්නා ලද වී ප්‍රමාණය තෙත් සහ වියළි කලාප සහ කන්න වශයෙන් සහ මුළු වී නිෂ්පාදනයේ සියයට ගණනක් වශයෙන්, II (ආ) 5 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ. පසුගිය වර්ෂවලදී මිලදී ගන්නා ලද වී වලින් සැලකිය යුතු අනුපාතිකයක් මිලදී ගෙන ඇත්තේ වියළි කලාපීය දිස්ත්‍රික්ක වලිනි.

## II (ආ) 5 වැනි සංඛ්‍යා සටහන

## 1973/1974 වර්ෂයෙහි කලාප සහ කන්න අනුව සහ නිෂ්පාදනයේ අනුපාතයන් අනුව වී අලෙවි මණ්ඩලයේ වී මිලදී ගැනීම්

(බුසල් වලින්)

| කලාප | 1973 | | | | 1974 | | | | 1973 | | 1974 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මහ 1972/73 | | යල 1973 | | මහ 1973/74 | | යල 1974 | | | | | |
| | මිලදී ගැනීම් | මුළු නිෂ්පාදනයේ ප්‍රතිශතය | මිලදී ගැනීම් | මුළු නිෂ්පාදනයේ ප්‍රතිශතය | මිලදී ගැනීම් | මුළු නිෂ්පාදනයේ ප්‍රතිශතය | මිලදී ගැනීම් | මුළු නිෂ්පාදනයේ ප්‍රතිශතය | මිලදී ගැනීම් | මුළු නිෂ්පාදනයේ ප්‍රතිශතය | මිලදී ගැනීම් | මුළු නිෂ්පාදනයේ ප්‍රතිශතය |
| තෙත් කලාපය .. | 2,341,000 | 19·2 | 830,000 | 8·4 | 1,993,800 | 13·1 | 1,108,700 | 10·4 | 3,171,000 | 14·3 | 3,102,500 | 11·9 |
| වියලි කලාපය .. | 16,354,000 | 54·9 | 3,118,000 | 28·3 | 13,198,600 | 35·4 | 4,563,800 | 33·9 | 19,472,000 | 47·7 | 17,762,400 | 35·0 |
| එකතුව .. | 18,695,000 | 44·5 | 3,948,000 | 18·8 | 15,192,400 | 28·9 | 5,672,500 | 23·5 | 22,643,000 | 36·0 | 20,864,900 | 27·2 |

මූලයන්: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ වී අලෙවි මණ්ඩලය.

**(ආ) අතිරේක ආහාර භෝග**

1972/73 සහ 1973/74 වගා වර්ෂයන්හි අතිරේක ආහාර භෝග අංශයෙහි ක්‍රියාකාරිත්වය II (ආ) 6 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

### II (ආ) 6 වැනි සංඛ්‍යා සටහන
### 1972/73 සහ 1973/74 වගා වර්ෂයන්හි (අ)
### අතිරේක ආහාර භෝග අංශයෙහි ක්‍රියාකාරිත්වය (ආ)

| භෝගය | වගා කළ ප්‍රමාණය (අක්කර) | | නිෂ්පාදනය (බුසල්) | | අක්කරයක ඵලදාව (බුසල්) | |
|---|---|---|---|---|---|---|
| | 1972/73 | 1973/74 | 1972/73 | 1973/74 | 1972/73 | 1973/74 |
| 1. මයියොක්කා .. | 127,137 | 225,642 | 13,022,600 | 16,723,912 | 102·43 | 74·12 |
| 2. ඉරිඟු .. | 59,928 | 95,128 | 268,381 | 469,394 | 4·48 | 4·93 |
| 3. මිරිස් .. | 90,903 | 102,672 | 382,427 | 312,580 | 4·21 | 5·10 |
| 4. රතුළූනු .. | 17,288 | 15,956 | 1,342,945 | 1,396,793(1) | 77·68 | 87·54 |
| 5. රට කජු .. | 15,378 | 19,078 | 181,814 | 144,774 | 11·82 | 7·59 |
| 6. මුං ඇට .. | 13,193 | 26,417 | 62,852 | 115,991 | 4·76 | 4·39 |
| 8. ඉදල් ඉරිඟු . | 2,932 | 3,048* | 22,160 | 30,249* | 7·43 | 9·92* |
| 10. සෝයා බෝංචි .. | 387 | 3,232 | 4,463 | 24,816 | 11·53 | 6·08 |
| 11. අර්තාපල් .. | 7,011 | 2,545** | 1,063,040 | 180,480** | 151·62 | 70·92** |
| 12. බොම්බයි ළූණු .. | 434 | 447 | 14,498 | 21,594 | 33·41 | 60·94 |
| 13. කුරක්කන් .. | 53,944** | 67,872* | 382,011 | 282,369 | 5,36** | 4·16 |
| 14. තල .. | 17,117 | 32,108 | 56,739 | 96,857 | 3·31 | 3·02 |
| 15. මෙනේරි .. | 1,101** | ලැ. නො. | 3,932** | ලැ. නො | 3·57** | — |
| 16. මෑ .. | 563** | 2,574** | 12,479 | 15,728 | 3·47** | 6·11 |
| 17. තණහාල් .. | 178** | ලැ. නො. | 635** | ලැ. නො. | 3·57** | — |
| 18. උඳු .. | 112** | 3,439 | 6,817 | 12,877 | 8·91** | 3·74 |
| 19. පරිප්පු .. | 71** | 3,274** | 987** | 32,727 | 13·90** | 10·00 |

මූලයන්: කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය

(අ) තාවකාලික ඇස්තමේන්තු.
(ආ) වගා වර්ෂය II (ආ) 3 වැනි සංඛ්‍යා සටහනෙහි පාද සටහන් (අ) හි විග්‍රහ කර ඇත.
* මහ පමණයි.
** යල පමණයි.
ලැ. නො. – ලැබී නොමැත.
(1) කොළ සහිත ළූනු බුසල් 88,290 ඇතුළත්ය.

1973/74 වගා වර්ෂයේ අතිරේක ආහාර භෝග (සම්පූර්ණ දත්තයන් ලබා ගත නොහැකි වූ මෙනේරි සහ සහ තණ හාල් හැර) වර්ග පහළොවක් (සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි) යටතේ වූ බිම් ප්‍රමාණය අක්කර 6,03,432 ක් වූ අතර, 1972/73 වගා වර්ෂයේ එය අක්කර 4,06,448 ක් විය. මයියොක්කා, මිරිස්, ඉරිඟු, කුරක්කන්, තල සහ මුං ඇට වගා කළ බිම් ප්‍රමාණය අක්කර 5,49,839 කි. එය සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති භෝග වර්ග 15 යටතේ වූ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 91·1 කි. 1972/73 වර්ෂයේ නිෂ්පාදනය සමග සසඳන කල, 1973/74 වර්ෂයේ මයියොක්කා, ඉරිඟු, රතු ළූනු සහ මුං ඇට නිෂ්පාදනය වැඩිවී ඇත.

**1974 වර්ෂයේ සිදු වූ වෙනස්වීම**

වර්ෂය තුළ ඵලදාවර්ධන කමිටු 390 ක් පිහිටුවීම නිසා දැනට ඇති මුළු ඵලදාවර්ධන කමිටු සංඛ්‍යාව 473 ක් විය. අවසාන වශයෙන් ඵලදාවර්ධන කමිටු 480 ක් පිහිටුවීමට අදහස් කෙරේ. 1974 වර්ෂය තුළ කෘෂි සේවා මධ්‍යස්ථාන 125 ක් පිහිටුවීම නිසා මෙම මධ්‍යස්ථාන මුළු ගණන 208 ක් විය.

වී බුසලක සහතික මිල 1974 මාර්තු මාසයේදී රුපියල් 25 සිට රුපියල් 30 දක්වා ද, ඉන් අනතුරුව 1974 ජූලි මාසයේදී රුපියල් 33 දක්වාද වැඩිවිය.

පොහොර සහනාධාරය පිළිබඳවද වෙනස්වීම් දෙකක් වර්ෂය තුළදී සිදු විය. අක්කරයකට යෙදීමට නියමිත පොහොර ප්‍රමාණයෙහි සාමාන්‍ය මිල ජූලි මාසයේදී රුපියල් 50 සිට රුපියල් 250 දක්වා හතර ගුණයකින් වැඩිවී ඇත. පසුව අක්කරයකට යෙදීමට නියමිත පොහොර ප්‍රමාණය සඳහා මිල රුපියල් 160 ක පමණ ප්‍රමාණයකට අඩු කරන ලදී. අවසාන වශයෙන් වූ මිල 1974 ජූලි මාසයට කලින් තිබූ මිලට වඩා සියයට 220 ක වැඩිවීමකි. කෙසේ වුවද, මෙම මිල වැඩිවීම මෙහි විමර්ශනයට භාජනය කෙරෙන 1974 වගා කන්නයන්ට බලපා නැත. මෙම මිල ඉහළ නැඟීම 1974/75 මහ කන්නයේ පාවිච්චියට ගන්නා ලද පොහොර සම්බන්ධව බලපෑමට පිළිවන. නියඟ තත්ත්වයන් වියළි කලාපයේ ඉතාමත් වැදගත් සාධකයක් වන නිසා පොහොර මිල වැඩිවීමේ බලපෑම පමණක් තනිව තීරණය කිරීම අපහසු ය.

1974/75 මහ කන්නයේදී මුළු රටටම බලපාන පරිදි ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ කෘෂිකාර්මික රක්ෂණ ව්‍යාපාරය නියඟ හේතූන් නිසා කල්දමන ලදී. මෙම ව්‍යාපාරය 1975 යල කන්නයේ සිට ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

**3. ග්‍රාමීය බැංකු කටයුතු සහ ණය**

1974 ග්‍රාමීය අංශය සඳහා ආයතනික ණය මූලික වශයෙන් බෙදා හැරියේ නව කෘෂිකාර්මික ණය ක්‍රමය, සමුපකාර ග්‍රාමීය බැංකු සහ කෘෂි සේවා මධ්‍යස්ථානවල පිහිටුවා ඇති ලංකා බැංකුවේ උප කාර්යාල මඟිනි. 1973 හඳුන්වා දුන් අංග සම්පූර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය, සමුපකාර ග්‍රාමීය බැංකු සහ ලංකා බැංකු උප කාර්යාල මඟින් ක්‍රියාත්මක වේ. මෙම ආයතන පිහිටුවා නොමැති ප්‍රදේශවල නැතහොත් අංග සම්පූර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයක් පිළිබඳ වැඩ පිළිවෙලක් නොමැති ප්‍රදේශවල පෙරදී මෙන් මහජන බැංකුව විසින් විවිධ සේවා සමුපකාර සමිති මඟින් වගා ණය දීම කරගෙන යන ලදී. මෙම සියලුම ක්‍රම මඟින් වර්ෂය තුළ බෙදා හරින ලද මුළු ණය ප්‍රමාණය රුපියල් 1,365 ලක්ෂයකි. මීට අමතරව, නියමිත කාර්යයන් සඳහා රජයේ දෙපාර්තමේන්තු විසින් මෙහෙය වනු ලැබූ ණය ක්‍රම මඟින් ද, වාණිජ බැංකු සහ විශේෂිත ණය දෙන ආයතන මඟින්ද ග්‍රාමීය අංශයට ණය සපයන ලදී.

නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ සහ අංග සම්පූර්ණ ග්‍රාමීය ණය ක්‍රමය යටතේ නියමිත භෝග සඳහා දෙනු ලබන වගා ණයවලින් ගෙවීම් පැහැර හරින ප්‍රමාණයෙන් සියයට 75 ක් සඳහා රජය වෙනුවෙන් ඇපවීම් ක්‍රමයක් මහ බැංකුව ක්‍රියාත්මක කරයි.

**(I) නව කෘෂිකාර්මික ණය ක්‍රමය**

සමුපකාර ග්‍රාමීය බැංකු මෙතෙක් පිහිටුවා නොමැති ප්‍රදේශවල හෝ මෙම බැංකු විසින් 1973 අංග සම්පූර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භ නොකළ ප්‍රදේශයන්හි මහජන බැංකුව 1967 නව කෘෂිකාර්මික ණය ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. මෙම ණය බෙදහරින ලද්දේ, විවිධ සේවා සමුපකාර සමිති මඟිනි. නිෂ්පාදන වියදම් වැඩිවීම හේතුකොටගෙන 1974 යල කන්නය අවසානය දක්වා මෙම ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරන ලද ණය සීමාවන්, 1974 සැප්තැම්බර් 23 වැනි දින[1] සිට බලපාන පරිදි වැඩි කරන ලදී.

පසුගිය කාලයේ මෙන්ම, දේශීය කෘෂිකර්මය සඳහා ප්‍රධාන වශයෙන් ආයතනික ණය සපයන ලද්දේ නව කෘෂිකාර්මික ණය ක්‍රමය මඟිනි. වර්ෂය තුළදී වී සහ අතිරේක භෝග වගාව සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණය වන රුපියල් 1,161 ලක්ෂයෙන් රුපියල් 1,093 ලක්ෂයක්ම දෙන ලද්දේ මෙම ක්‍රමය යටතේ ය.

**(අ) වී වගා ණය**

නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය මුදල, එයින් ආපසු ගෙවන ලද ප්‍රමාණය සහ කල් පසුවූ ගෙවීම් ප්‍රමාණය II (ආ) 7 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

---

1. වැඩි විස්තර සඳහා 1974 සැප්තැම්බර් මස ශ්‍රී ලංකා මහ බැංකු විවරණිකාව බලන්න.

### නව කෘෂිකාර්මික ණය

| ශීර්ෂය | ප්‍රමාණය රුපියල් දශලක්ෂ වලින් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මහ 67/68 | යල 1968 | මහ 68/69 | යල 1969 | මහ 69/70 | යල 1970 | මහ 70/71 | යල 1971 | මහ 71/72 | යල 1972 | මහ 72/73 | යල 1973 | මහ 73/74 |
| දෙන ලද ණය .. | 61·4 | 11·3 | 45·8 | 9·9 | 39·3 | 12·4 | 23·5 | 5·8 | 24·0 | 6·7 | 20·3 | 8·0 | 84·2 |
| මුළු ආපසු ගෙවීම .. | 52·7 | 9·7 | 28·2 | 8·1 | 20·3 | 8·6 | 12·5 | 4·9 | 14·4 | 5·1 | 12·6 | 4·6 | 36·1 |
| එයින්: (අ) සිය කැමැත්තෙන් .. | 43·7 | 9·2 | 26·1 | 7·8 | 20·3 | 8·0 | 12·5 | 4·9 | 14·4 | 5·1 | 12·6 | 4·6 | 36·1 |
| (ආ) සහල් සලාකයෙන් .. | 9·0 | 0·5 | 2·1 | 0·3 | — | 0·6 | — | — | — | — | — | — | — |
| භෝග විනාශය නිසා දීර්ඝකිරීම .. | 0·1 | — | 0·8 | — | 0·1 | — | — | — | — | — | — | — | — |
| අයවිය යුතු එහෙත් පැහැර නොහැරි .. | — | — | — | — | — | — | — | — | — | — | — | — | 0·8 |
| පැහැර හැරීම .. | 8·6 | 1·6 | 16·8 | 1·8 | 18·9 | 3·8 | 11·0 | 0·9 | 9·6 | 1·6 | 7·7 | 3·4 | 47·3 |

* අසම්පූර්ණ දත්තයන්.

II (ආ) 7 වැනි සංඛ්‍යා සටහන

ක්‍රමය — වී වගා ණය

| | | දෙන ලද මුදලේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| යල* 1974 | මහ* 74/75 | මහ 67/68 | යල 1968 | මහ 68/69 | යල 1969 | මහ 69/70 | යල 1970 | මහ 70/71 | යල 1971 | මහ 71/72 | යල 1972 | මහ 72/73 | යල 1973 | මහ 73/74 | යල 1974* | මහ 74/75* |
| 24·8 | 42·4 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |
| 10·4* | 0·1 | 85·9 | 85·8 | 61·6 | 81·8 | 51·6 | 69·4 | 53·2 | 84·5 | 60·0 | 76·1 | 62·1 | 57·5 | 42·9 | 41·9 | 0·2 |
| 10·4 | 0·1 | 71·2 | 81·4 | 57·0 | 78·8 | 51·6 | 64·5 | 53·7 | 84·5 | 60·0 | 76·1 | 62·1 | 57·5 | 42·9 | 41·9 | 0·2 |
| — | — | 14·7 | 4·4 | 4·6 | 3·0 | — | 4·9 | — | — | — | — | — | — | — | — | — |
| — | — | 0·1 | — | 1·7 | — | 0·3 | — | — | — | — | — | — | — | — | — | — |
| 13·2 | 42·3 | — | — | — | — | — | — | — | — | — | — | — | — | 0·9 | 53·2 | 99·8 |
| 1·2 | — | 14·0 | 14·2 | 36·7 | 18·2 | 48·1 | 30·6 | 46·8 | 15·5 | 40·0 | 23·9 | 37·9 | 42·5 | 56·2 | 4·9 | — |

මූලය: මහජන බැංකුව.

නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ පාවිච්චි කරන ලද ණය ප්‍රමාණය අඩුවීමේ උපනතියේ තියුණු ආපසු හැරීමක් 1973/74 මහ කන්නය තුළ බෙදහරින ලද ණය ප්‍රමාණයෙන් දක්වේ. කන්නය තුළ දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් 842 ලක්‍ෂයකි. එය 1972/73 මහ කන්නයේ දෙන ලද ප්‍රමාණයට වඩා (සියයට 314·8 ක්) සැලකිය යුතු වැඩිවීමක් පෙන්වයි. 1973 දී ණය සීමාවන් ඉහළ දැමීමත්, ආපසු ගෙවීම පැහැර හැරියවුන් නැවතත් ණය ලබා ගැනීමට සුදුස්සන් වීමත් සහ ආහාර නිෂ්පාදනය කෙරෙහි වැඩි අවධානය යොමුවීමත් නිසා මෙලෙස බෙදහරින ලද ණය ප්‍රමාණය ඉහළ මට්ටමකට ළඟාවීමට මූලික හේතු ලෙස සැළකීමට පිළිවන. 1974 යල කන්නයේ වී වගාව සඳහා දෙන ලද ණය මුදල, පෙර යල කන්නයේ දෙන ලද ණය ප්‍රමාණයට වඩා සියයට 210·0 කින් වැඩිය. 1973/74 වගා වර්ෂයේදී පාවිච්චි කරන ලද මුළු ණය මුදල රුපියල් 1,090 ලක්ෂයක් වූ අතර, 1967 මෙම ණය ක්‍රමය ආරම්භ කළාට පසු ඉතා ඉහළ පරිමාණයක ණය ප්‍රමාණයක් පාවිච්චි කර ඇත්තේද මෙම වර්ෂයේදී ය.

අසම්පූර්ණ දත්තයනට අනුව 1974/75 මහ කන්නය තුළදී දෙන ලද ණය මුදල රුපියල් 424 ලක්ෂයකි. එය පෙර මහ කන්නයේ දී දෙන ලද මුළු ණය මුදලින් භාගයක් පමණ වේ.

1972/73 මහ කන්නයේ සියයට 62·1 ක් වූ ණය ආපසු ගෙවීම් සමඟ සසඳන කල, 1973/74 මහ කන්නයේදී ණය ආපසු ගෙවීම් ප්‍රමාණය සියයට 42·9 කි. නව කෘෂිකාර්මික ණය ක්‍රමය ආරම්භ කිරීමේ පටන් මෙතෙක් වාර්තාවී ඇති ඉතාමත් අඩු ආපසු ගෙවීම් ප්‍රමාණය මෙය වන අතර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වාර්තාකොට ඇති පරිදි 1973/74 මහ කන්නයේ ඉතා ඉහළ වී නිෂ්පාදනයත්, එම කන්නය තුළ සිදුවූ ඉතාමත් අඩු වගා පාලුවත් සමඟ සලකන විට මෙය ඉතාමත් අසතුටුදායක තත්ත්වයක් පෙන්වයි. 1973/74 මහ කන්නය තුළදී වී අලෙවි මණ්ඩලය අඩු වී ප්‍රමාණයක් මිලදී ගැනීම සමහරවිට මෙම ඉතාමත් අඩු ණය ආපසු ගෙවීම් අනුපාතිකය තරමක් පැහැදිලි කරයි. දත්තයන් අසම්පූර්ණ හෙයින් 1974 යල කන්නයේදී ණය ආපසු ගෙවීම් අනුපාතිකය වන සියයට 41·9 න් මෙම කන්නයේ ණය ආපසු ගෙවීම් සම්පූර්ණ තත්ත්වය පෙන්නුම් නොකරයි.

1973/74 මහ කන්නයේ සහ 1974 යල කන්නයේ වී වගා ණය පිළිබඳ දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය 63 වැනි පරිශිෂ්ය සංඛ්‍යා සටහනින් දක්වේ.

1973/74 වගා වර්ෂය තුළදී වැඩිම ණයදීම් ප්‍රමාණය අම්පාර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර, එය රුපියල් 171 ලක්ෂයක් හෙවත් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 15·7 කි. 1973/74 මහ කන්නය තුළදී ඉතාමත් ඉහළ ආපසු ගෙවීම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ, (සියයට 88·3 ක) රත්නපුර දිස්ත්‍රික්කයෙනි.

(ආ) අතිරේක ආහාර භෝග උක් සහ කපු වගාව සඳහා ණය

අතිරේක ආහාර භෝග, උක් සහ කපු වගාව සඳහා බෙදහරින ලද ණය II (ආ) 8 සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ. මේ වගාවන් සඳහා දෙන ලද මුළු ණය මුදලින් වැඩිම කොටසක් (රුපියල් 108 ලක්ෂයක්) දී ඇත්තේ, මිරිස් සඳහා වන අතර, එය සියලුම භෝග සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 43·1 කි.

නව කෘෂිකාර්මික ණය ක්‍රමය උක් සහ කපු වගාවද ඇතුළු වන පරිදි පුළුල් කළ අතර, එම භෝග දෙක සඳහා පළමුවරට වගා ණය මුදල් ලබා දී ඇත්තේ 1973/74 දීය. පසුගිය වර්ෂයේදී දෙන ලද ප්‍රමාණයට වඩා මෙම වර්ෂයේදී අතිරේක ආහාර භෝග සඳහා දෙන ලද ණය මුදල සියයට 138·2 කින් වැඩිවිය. අසම්පූර්ණ දත්තයන්ට අනුව පසුගිය වගා වර්ෂාවසාන තත්ත්වයන් සමඟ සසඳන කල 1974/75 වගා වර්ෂය තුළදී මෙම භෝගයන් සඳහා දී ඇති ණය ප්‍රමාණයේ අඩුවීමක් දක්වයි. වියළි කලාපයේ පැවති නියඟ තත්ත්වයන් නිසා වගා වර්ෂය ආරම්භ කිරීම ප්‍රමාදවීම, මෙම අඩුවීමට හේතු වන්නට ඇත. 1972/73 වගා වර්ෂයේදී දෙන ලද මුදලින් සියයට 60·6 ක් ආපසු ලබාගත් අතර, එය පසුගිය වර්ෂයේ ආපසු ගෙවීම් මට්ටමට වඩා සියයට 11·7 කින් අඩුය. දත්තයන් අසම්පූර්ණව පැවතීම හේතුකොට ගෙන 1973/74 මහ කන්නයේ ණය ආපසු ගෙවීමේ සියයට ගණන ණය ආපසු ගෙවීමේ නියම අනුපාතය පෙන්නුම් නොකරයි.

## II (ආ) 8 වැනි සංඛ්‍යා සටහන

### නව කෘෂිකාර්මික ණය ක්‍රමය - අතිරේක භෝග, උක් සහ කපු සඳහා වගා ණය

| වගා වර්ෂය | දෙන ලද මුදල (රුපියල් දහස් ගණනින්) | | | | | | | | සියළුම භෝගවල ආපසු ගෙවීමේ තත්ත්වය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | දෙන ලද මුදලේ ප්‍රතිශතයක් වශයෙන් | | | |
| | මිරිස් | රතුළූණු | අර්තාපල් | එළවලු | අනෙකුත් අතුරු ආහාර භෝග | උක් | කපු | එකතුව | මුළු ආපසු ගෙවීම රු. '000 | භෝග විනාශය නිසා දීඝ කිරීම රු. '000 | අයවියයුතු එහෙත් පැහැර නොහැරි රු. '000 | පැහැර හැරීම රු. '000 | මුළු ආපසු ගෙවීම | භෝග විනාශය නිසා දීඝ කිරීම | අයවියයුතු එහෙත් පැහැර නො හැරි | පැහැර හැරීම |
| 1967 – 68 .. | 1,947 | 1,979 | 1,145 | 412 | — | — | — | 5,483 | 4,531 | — | — | 952 | 82·6 | — | — | 17·4 |
| 1968 – 69 .. | 2,058 | 2,468 | 1,507 | 435 | — | — | — | 6,468 | 5,251 | — | — | 1,217 | 81·2 | — | — | 18·8 |
| 1969 – 70 .. | 2,359 | 3,011 | 1,836 | 342 | 6* | — | — | 7,554 | 5,626 | — | — | 1,928 | 74·5 | — | — | 25·5 |
| 1970 – 71 .. | 1,202 | 1,606 | 2,243 | 137 | 7* | — | — | 5,195 | 4,116 | — | — | 1,079 | 79·2 | — | — | 20·8 |
| 1971 – 72 .. | 2,039 | 2,950 | 4,230 | 255 | — | — | — | 9,474 | 6,848 | — | — | 2,626 | 72·3 | — | — | 27·7 |
| 1972 – 73 .. | 3,690 | 1,886 | 4,407 | 141 | 26* 1** | — | — | 10,151 | 6,151 | — | 820 | 3,180 | 60.6 | — | 8·1 | 31·3 |
| 1973 – 74 .. | 10,767 | 6,471 | 6,526 | 167 | 247* 6** | 612 | 159 | 24,955 | 10,546† | — | 4,319 | 10,090 | 42·3† | — | 17·3 | 40·4 |
| 1974 – 75† .. | 2,236 | 2,848 | 1,940 | 95 | 108* | 35 | — | 7,262 | 1 | — | — | — | — | — | — | — |

මූලය: මහජන බැංකුව.

* රටකජු, ඉරිඟු, සහ අනෙක් භෝග
** බොම්බයි ළූණු.
† අසම්පූර්ණ දත්තයන්.

## ග්‍රාමීය බැංකුවල තැන්පතු හා

| මාසය අවසානය | බැංකු ගණන | තැන්පතු ගිණුම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉතුරුම් | | | ස්ථාවර | | | එකතුව | | |
| | | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය |
| 1965 දෙසැම්බර් .. | 8 | 2,924 | 491,626 | 168 | 9 | 4,734 | 526 | 2,933 | 496,360 | 169 |
| 1966 දෙසැම්බර් .. | 13 | 4,636 | 703,011 | 152 | 15 | 22,737 | 1,516 | 4,651 | 725,748 | 156 |
| 1967 දෙසැම්බර් .. | 27 | 8,792 | 1,305,846 | 118 | 41 | 65,381 | 1,595 | 8,833 | 1,371,227 | 155 |
| 1968 දෙසැම්බර් .. | 44 | 17,359 | 3,110,576 | 179 | 287 | 222,614 | 776 | 17,646 | 3,333,190 | 189 |
| 1969 දෙසැම්බර් .. | 68 | 28,626 | 5,712,893 | 199 | 724 | 460,168 | 636 | 29,350 | 6,173,061 | 210 |
| 1970 දෙසැම්බර් .. | 90 | 49,939 | 16,109,287 | 322 | 892 | 799,117 | 896 | 50,831 | 16,908,405 | 333 |
| 1971 දෙසැම්බර් .. | 111 | 60,371 | 17,188,297 | 285 | 838 | 676,106 | 807 | 61,209 | 17,864,403 | 292 |
| 1972 දෙසැම්බර් .. | 242 | 702,822 | 22,703,136 | 221 | 812 | 617,150 | 760 | 103,634 | 23,320,586 | 225 |
| 1973 මාර්තු .. | 287 | 118,277 | 25,599,969 | 216 | 724 | 610,340 | 843 | 119,001 | 26,170,309 | 219 |
| ජූනි .. | 309 | 135,695 | 30,082,027 | 222 | 704 | 658,499 | 935 | 136,399 | 30,740,526 | 225 |
| සැප්තැම්බර් .. | 332 | 164,195 | 33,716,197 | 205 | 1,353 | 1,419,189 | 1,049 | 165,548 | 35,135,386 | 212 |
| දෙසැම්බර් .. | 341 | 206,970 | 44,281,601 | 214 | 748 | 872,935 | 1,167 | 207,718 | 45,154,536 | 217 |
| 1974 මාර්තු .. | 355 | 249,339 | 44,613,320 | 179 | 838 | 1,070,270 | 1,277 | 250,177 | 45,683,590 | 183 |
| ජූනි . | 360 | 291,284 | 53,056,840 | 182 | 953 | 1,165,816 | 1,223 | 292,237 | 54,222,656 | 186 |
| සැප්තැම්බර් .. | 338 | 326,116 | 57,653,479 | 177 | 787 | 1,189,787 | 1,512 | 376,903 | 58,843,266 | 180 |
| දෙසැම්බර් .. | 332 | 366,203 | 61,549,118 | 167 | 1,271 | 1,186,243 | 933 | 367,474 | 62,735,361 | 171 |

II (ආ) 9 වැනි සංඛ්‍යා සටහන

අත්තිකාරම් 1965-1974

ප්‍රමාණය රුපියල් වලින්

| අත්තිකාරම් | | | | | | | | | | | | මුළු තැන්පතු හා මුළු අත්තිකාරම් අතර වෙනස |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කෙටි කාලීන ණය | | | උකස් | | | එකතුව | | | | | | |
| සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | | | | |
| 1,153 | 914,699 | 793 | ලැ.නො. | 252,596 | — | — | 1,167,295 | — | | | | − 670,935 |
| 1,783 | 1,326,457 | 744 | 4,222 | 427,129 | 101 | 6,005 | 1,753,586 | 292 | | | | −1,027,838 |
| 2,897 | 2,029,476 | 701 | 6,598 | 633,213 | 96 | 9,495 | 2,662,689 | 280 | | | | −1,291,462 |
| 5,586 | 3,630,731 | 650 | 9,507 | 1,085,613 | 114 | 15,093 | 4,716,344 | 312 | | | | −1,383,154 |
| 7,893 | 5,572,281 | 706 | 14,325 | 1,523,646 | 106 | 22,218 | 7,095,927 | 319 | | | | − 922,866 |
| 10,017 | 7,122,213 | 711 | 18,092 | 1,980,066 | 109 | 28,109 | 9,102,279 | 324 | | | | +7,806,126 |
| 10,725 | 7,144,913 | 666 | 21,044 | 2,171,734 | 103 | 31,769 | 9,316,647 | 293 | | | | +8,547,756 |
| 11,515 | 8,226,663 | 714 | 60,735 | 6,958,250 | 115 | 72,250 | 15,184,913 | 210 | | | | +8,135,673 |
| 12,619 | 9,150,305 | 725 | 75,344 | 8,663,631 | 115 | 87,963 | 17,813,936 | 203 | | | | +8,356,373 |
| 13,622 | 10,415,296 | 765 | 88,359 | 10,751,708 | 122 | 101,981 | 21,173,004 | 208 | | | | +9,567,522 |
| 15,721 | 12,640,518 | 804 | 121,337 | 17,034,204 | 140 | 137,058 | 29,674,722 | 217 | | | | +5,460,664 |
| 20,548 | 16,177,708 | 787 | 150,118 | 22,734,438 | 151 | 170,666 | 38,912,146 | 228 | | | | +6,242,390 |
| 26,438 | 21,086,710 | 798 | 187,594 | 29,045,830 | 155 | 214,032 | 50,132,540 | 234 | | | | −4,448,950 |
| 31,837 | 25,730,820 | 808 | 194,546 | 30,691,836 | 158 | 226,383 | 56,422,656 | 249 | | | | −2,200,000 |
| 24,442 | 24,514,511 | 1,003 | 217,289 | 34,814,543 | 160 | 241,731 | 59,329,054 | 245 | | | | − 485,788 |
| 26,819 | 29,008,262 | 1,081 | 235,115 | 38,398,508 | 163 | 261,934 | 67,406,770 | 257 | | | | −4,871,409 |

මූලය: මහජන බැංකුව.

අතිරේක භෝග, උක් සහ කපු වගාව සඳහා දෙන ලද ණය පිළිබඳ දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය 64 වැනි පරිශිෂ්ඨ සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ. පසුගිය අවුරුද්දේ මෙන්ම මෙම වර්ෂයේද මිරිස් (සියයට 41·5 ක්) සහ ළූනු (සියයට 66·6 ක්) සඳහා දෙනු ලැබූ මුළු ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් යාපනය දිස්ත්‍රික්කයට විය. අර්තාපල් (සියයට 70·5 ක්) සහ උක් වගාව (සියයට 91·5 ක්) සඳහා දෙනු ලැබූ මුළු ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රයෝජනයට ගෙන ඇති අතර, මෙම ණය ක්‍රමය යටතේ කපු සඳහා ණය ලබා දී ඇත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයට පමණි.

(II) ග්‍රාමීය බැංකු

ග්‍රාමීය බැංකුවල තැන්පතු සහ අත්තිකාරම් II (ආ) 9 වැනි සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ.

1974 වර්ෂාවසානයේදී ග්‍රාමීය බැංකු ගණන 332 ක් වන අතර, එය 1973 වර්ෂාවසානයේ තිබූ ප්‍රමාණයට වඩා සුළු ගණනකින් අඩු ය. විවිධ සේවා සමුපකාර සමිති ප්‍රතිසංවිධානය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමහර ග්‍රාමීය බැංකු කිපයක් ඒකාබද්ධ කිරීම නිසා මෙම වෙනස සිදු විය. ග්‍රාමීය බැංකු 71 ක් ග්‍රාමීය බැංකු 50 ක් සමග සම්බන්ධකොට ඒවා විශේෂ ශාඛා වශයෙන් ක්‍රියාත්මක වෙයි.

II (ආ) 9 වැනි සංඛ්‍යා සටහනින් පෙන්වන පරිදි, 1974 අවසානය වනවිට ග්‍රාමීය බැංකුවල ඉතුරුම් තැන්පතු ප්‍රමාණය රුපියල් ලක්ෂ 627 ක් විය. එය පෙර වර්ෂයේ ඉතුරුම් තැන්පතුවලට වඩා සියයට 38·7 කින් වැඩි වෙයි. 1974 අවසානයේදී අයවිය යුතු මුළු ණය ප්‍රමාණය රුපියල් 290 ලක්ෂයක් විය. මෙසේ ශුද්ධ තැන්පතු ප්‍රමාණය රුපියල් 335 ලක්ෂයක් වූ අතර, එය පෙර වර්ෂයේ ශුද්ධ තැන්පතු තත්ත්වයට වඩා සුළු දියුණුවක් පෙන්වයි. සියළුම ග්‍රාමීය බැංකුවල සාමාන්‍ය ශුද්ධ තැන්පතු ප්‍රමාණය එක් බැංකුවකට රුපියල් 1,00,985 ක් බැගින් වෙයි. උකස් තැබීම යටතේ දෙන ලද ණය වර්ෂය තුළ නොකඩවා වැඩි වූ අතර, වර්ෂය අවසාන වන විට අයවිය යුතු මුළු ණය ප්‍රමාණය පෙර වර්ෂයට වඩා සියයට 69·2 කින් වැඩි විය. 1973 අවසානයේදී ග්‍රාමීය බැංකුවල ධන ශුද්ධ තැන්පතු තත්ත්වය (මුළු තැන්පතු සහ මුළු අත්තිකාරම් අතර වෙනස) 1974 වර්ෂය අවසානයේදී ඍණ තත්ත්වයක් බවට පත් වූයේ වර්ෂය තුළ කෙටි කාලීන ණය හා උකස් තැබීම යටතේ දෙන ලද ණය ප්‍රමාණය ඉහළ යාම නිසාය

කාර්යයන් අනුව ග්‍රාමීය බැංකු විසින් බෙදහරින ලද ණය මුදල් ප්‍රමාණය II (ආ) 10 වැනි සංඛ්‍යා සටහනින් දක්වේ පෙර වර්ෂයට වඩා මෙම වර්ෂයේ නිෂ්පාදනය සඳහා දෙන ලද ණය සියයට 36·6 කින්ද, පරිභෝජනය[1] සඳහා දෙන ලද ණය සියයට 94·4 කින්ද වැඩිවිය.

දිස්ත්‍රික්ක අනුව ග්‍රාමීය බැංකුවල තැන්පතු හා අත්තිකාරම් පිළිබඳ විශ්ලේෂණය 65 වැනි පරිශිෂ්ඨ සංඛ්‍යා සටහනෙහි දක්වේ.

පෙර වර්ෂයේ දිස්ත්‍රික්ක 20 සමහ සසඳන කල, 1974 වර්ෂයේ ධන ශුද්ධ තැන්පතු තත්ත්වයක් පෙන්වූයේ දිස්ත්‍රික්ක හයක පමණි. 1973 වර්ෂයේ මෙන් මෙම වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයෙහි විශාලතම ධන ශුද්ධ තැන්පතු ප්‍රමාණයක් වූ අතර, විශාල ඍණ ශුද්ධ තැන්පතු ප්‍රමාණයක් පෙන්වූයේ යාපනය දිස්ත්‍රික්කයෙහි ග්‍රාමීය බැංකුවල ය. 1974 දිස්ත්‍රික්ක වැඩි ගණනක ග්‍රාමීය බැංකුවල ඍණ තැන්පතු ප්‍රමාණයක් වාර්තා වී ඇත. පෙර වර්ෂය සමහ සසඳන කල මෙය ග්‍රාමීය බැංකු ක්‍රියාකාරිත්වයෙහි පසුබෑස්මකි.

1 නිවාස ඉදිකිරීම, ණයෙන් නිදහස්වීම, පරිභෝජනය හා විද්‍යුත්කරණය සඳහා දුන් ණය මීට ඇතුළත් වේ.

## II (ආ) 10 වැනි සංඛ්‍යා සටහන

### කාර්යයන් අනුව ග්‍රාමීය බැංකු ණය—වර්ෂය අවසානයේදී

| කාර්යය | ප්‍රමාණය රුපියල් වලින් 1973 | ප්‍රමාණය රුපියල් වලින් 1974 | සියයට වැඩිවීම 1974 | එකතුවෙන් සියයට ගණන 1973 | එකතුවෙන් සියයට ගණන 1974 |
|---|---|---|---|---|---|
| නිෂ්පාදනය .. | 4,972,425 | 6,792,835 | 36·6 | 29·6 | 23·4 |
| එයින්: | | | | | |
| 1. කෘෂිකර්මයට .. | 4,258,530 | 5,417,264 | 27·2 | 25·4 | 18·7 |
| 2. සත්ව පාලනයට .. | 338,963 | 705,627 | 108·2 | 2·0 | 2·4 |
| 3. ගෘහ කර්මාන්තයට .. | 374,932 | 669,944 | 78·7 | 2·2 | 2·3 |
| නිවාස .. | 5,878,952 | 11,822,468 | 101·1 | 35·0 | 40·7 |
| ණයෙන් මිදීම .. | 3,635,801 | 6,947,658 | 91·1 | 21·6 | 24·0 |
| වෙළඳාම . | 731,718 | 1,102,465 | 50·7 | 4·4 | 3·8 |
| පරිභෝජනය .. | 719,674 | 1,086,127 | 50·9 | 4·3 | 3·7 |
| විද්‍යුත්කරණය .. | 49,177 | 139,334 | 183·3 | 0·3 | 0·5 |
| අනෙකුත් .. | 806,987 | 1,117,375 | 38·5 | 4·8 | 3·9 |
| එකතුව . | 16,794,734 | 29,008,262 | 72·7 | 100·0 | 100·0 |

මූලය: මහජන බැංකුව.

**(iii) ලංකා බැංකුවේ ග්‍රාමීය ණය ක්‍රමය**

පෙර වර්ෂය අවසානයේදී කෘෂි සේවා මධ්‍යස්ථානවල ක්‍රියාත්මක වූ ලංකා බැංකු උප කාර්යාල 79 සමග සසඳන කල, 1974 අවසානයේදී මෙම උප කාර්යාල ගණන 202 ක් විය.

1974 වර්ෂාවසානයට ලංකා බැංකු උප කාර්යාලවල තිබූ තැන්පතු හා අත්තිකාරම ප්‍රමාණය II (ආ) 11 වැනි සංඛ්‍යා සටහනින් දක්වේ. වර්ෂාවසානයේදී මෙම උප කාර්යාලවල තිබූ ශුද්ධ තැන්පතු ප්‍රමාණය (ජංගම ගිණුම්වල මුදල් ශේෂ හැර) රුපියල් 27 ලක්ෂයක් නැතහොත් එක් උප කාර්යාලයකට රුපියල් 13,587 ක් විය. මෙය 1973 අවසානය වන විට තිබූ තැන්පතු ප්‍රමාණයට වඩා රුපියල් 12 ලක්ෂයකින් වැඩිවීමකි. ජංගම ගිණුම්වල වූ මුදල් ශේෂ ද සමග ගත්විට 1974 ශුද්ධ තැන්පතු ප්‍රමාණය රුපියල් 135 ලක්ෂයක් හෝ එක් උප කාර්යාලයකට රුපියල් 66,797 ක් හෝ වේ. මෙය 1973 අවසානයේ වූ ප්‍රමාණය වන රුපියල් 35 ලක්ෂයේ සිට වූ සැලකිය යුතු වැඩිවීමකින් සමන්විත වේ.

**II (ආ) 11 වැනි සංඛ්‍යා සටහන**

**කෘෂි සේවා මධ්‍යස්ථානයන්හි - ලංකා බැංකු උප කාර්යාල**
**1974 දෙසැ. 31 වැනි දිනට, තැන්පතු හා අත්තිකාරම්**

| ගිණුමේ සවභාවය | ගිණුම් සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් වලින් |
|---|---|---|
| තැන්පතු ගිණුම් | | |
| ජංගම ගිණුම් .. .. | 5,718 | 11,078,066 |
| ඉතිරිකිරීමේ ගිණුම් .. .. | 35,593 | 10,363,444 |
| විශේෂ ඉතිරිකිරීමේ ගිණුම් .. .. | 98 | 30,100 |
| ස්ථාවර ගිණුම් .. .. | 22 | 92,760 |
| එකතුව .. .. | 41,431 | 21,564,370 |
| අඩුකළා ජංගම ගිණුම් .. .. | 35,713 | 10,486,304 |
| අත්තිකාරම | | |
| ණය මුදල් .. .. | 6,321 | 7,741,758 |
| අයිරා .. .. | 77 | 329,678 |
| එකතුව .. .. | 6,398 | 8,071,436 |

මූලය. ලංකා බැංකුව.

1974 දී ලංකා බැංකු උප කාර්යාල මගින් දෙන ලද මුළු ණය මුදල් ප්‍රමාණය රුපියල් 76 ලක්ෂයකි. මෙයින් විශාල අනුපාතිකයක් (සියයට 44·8 ක්) යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා දී ඇති බව II (ආ) 12 වැනි සංඛ්‍යා සටහනින් පෙනේ.

### II (ආ) 12 වැනි සංඛ්‍යා සටහන

### කෘෂිසේවා මධ්‍යස්ථානයන්හි පිහිටි—ලංකා බැංකු උප කාර්යාලවල කාර්යයන් අනුව ණය – 1974

| කාර්යය | ප්‍රමාණය රුපියල් වලින් | | එකතුවෙන් සියයට ගණන | |
|---|---|---|---|---|
| නිෂ්පාදනය | | 3,238,008 | | 42·86 |
| එයින්: | | | | |
| (අ) වී වගාව .. | 2,370,809 | | 31·38 | |
| (ආ) අනිකුත් අතිරේක භෝග .. | 867,199 | | 11·48 | |
| යන්ත්‍රෝපකරණ මිලට ගැනීම .. | | 3,384,683 | | 44·80 |
| ළිං කැනීම .. | | — | | — |
| අළුත් බිම් සංවර්ධනය .. | | — | | — |
| භෝග විවිධාංගිකරණය .. | | 68,594 | | 0·91 |
| පශු පාලනය .. | | 58,500 | | 0·78 |
| කුකුලන් ඇතිකිරීම .. | | 25,020 | | 0·33 |
| කුඩා කර්මාන්ත .. | | 11,500 | | 0·15 |
| ණයන් මිදීම .. | | 50,850 | | 0·67 |
| නිවාස තැනීම .. | | 372,628 | | 4·93 |
| වෙළඳාම .. | | 79,500 | | 1·05 |
| විද්‍යුත්කරණය .. | | — | | — |
| පාරිභෝජනය .. | | 122,910 | | 1·63 |
| අනෙකුත් .. | | 143,004 | | 1·89 |
| එකතුව .. | | 7,555,197 | | 100·0 |

මූලය: ලංකා බැංකුව

මෙම දුන් ණය මුදල් 1973 අවසානයේදී රුපියල් 39,720 ක් වූ අතර, එය 1974 අවසානය වන විට රුපියල් 34 ලක්ෂය දක්වා සැලකිය යුතු ලෙස වැඩිවී ඇත. වර්ෂයේ දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 42·9 ක් නිෂ්පාදනය සඳහා දී ඇති අතර, එයින්ද විශාල කොටසක් වී වගාව සඳහා විය. 1973 ණය ව්‍යුහය සමග සසඳන කල, 1974 මුළු ණය ව්‍යුහයේ සුළු වෙනස්වීමක් වී ඇති බව පෙනේ. කෘෂිකාර්මික නිෂ්පාදනයට සහ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීමට දෙන ලද ණය ප්‍රමාණය මුළු ණය ප්‍රමාණයෙන් සියයට 87·7 කි.

දිස්ත්‍රික්ක අනුව උප කාර්යාලවල තත්ත්වය 66 වැනි පරිශිෂ්ඨ සංඛ්‍යා සටහනෙහි දැක්වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි උප කාර්යාලවල විශාලතම තැන්පතු ප්‍රමාණයක් (රුපියල් 30ලක්ෂයක්) වාර්තා වී ඇති අතර, එක් තැන්පතු ගිණුමක් සඳහා වැඩිම මුදල් ශේෂයක් (රුපියල් 1,463) වාර්තා වී ඇත්තේ බදුල්ල දිස්ත්‍රික්කයෙන්ය. විශාල ණය ප්‍රමාණයක් දී ඇති දිස්ත්‍රික්කය අනුරාධපුරය වන අතර, එක් ණය ගිණුමක වැඩිම මුදල් ශේෂයක් (රුපියල් 51,463) වාර්තා වී ඇත්තේ මන්නාරම දිස්ත්‍රික්කයෙහිය.

**(iv) ග්‍රාමීය ණය, සමස්ථ වශයෙන් අගැයීම**

ඉහතින් විග්‍රහ කරන ලද ක්‍රම තුන යටතේ වූ ග්‍රාමීය ණය පිළිබඳ සමස්ථ තත්ත්වය II (ආ) 13 සහ II (ආ) 14 වැනි සංඛ්‍යා සටහන් වලින් ඉදිරිපත් කොට ඇත.

## II (අා) 13 වැනි සංඛ්‍යා සටහන

## 1974 දී ග්‍රාමීය අංශයට සපයන ලද ණය* පරමාර්ථ අනුව දක්වීම

ප්‍රමාණය රුපියල්

| කාර්යය | නව කෘෂිකාර්මික ණය ක්‍රමය-මහජන බැංකුව | ග්‍රාමීය බැංකු | ලංකා බැංකුවේ ණය ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|
| ශෝග වගාව .. | 109,276,000 | 3,583,712 | 3,238,008 | 116,097,720 |
| එයින්: .. | | | | |
| (i) වී වගාව .. | 89,375,000 | | 2,370,809 | |
| (ii) අතිරේක ශෝග .. | 19,095,000 | | 867,199 | |
| (iii) උක් සහ කපු | 806,000 | | | |
| සත්ව පාලනය .. | | 561,606 | 83,520 | 645,126 |
| කුඩා කර්මාන්ත .. | | 537,520 | 11,500 | 549,020 |
| ශෝග විවිධාංගිකරණය .. | | — | 68,594 | 68,594 |
| යන්ත්‍රෝපකරණ මිළට ගැනීම .. | | — | 3,384,683 | 3,384,683 |
| ණය බේරීම .. | | 4,469,660 | 50,850 | 4,520,510 |
| පරිභෝජනය .. | | 353,975 | 122,910 | 476,885 |
| නිවාස තැනීම .. | | 8,107,079 | 372,628 | 8,479,707 |
| විද්‍යුත්කරණය .. | | 109,435 | — | 109,435 |
| ළිං කැනීම .. | | — | — | — |
| වෙළඳාම .. | | 740,170 | 79,500 | 819,670 |
| අනෙකුත් .. | | 1,246,420 | 143,004 | 1,389,424 |
| එකතුව .. | 109,276,000 | 19,709,577 | 7,555,197 | 136,540,77 4 |

මූලයන්: ලංකා බැංකුව, මහජන බැංකුව.

* 1974 දෙසැම්බර් 31 වැනි දිනට රු. 329,678 අයිරා ශේෂයක් සහ රු 38,398,508 උගසෙන් බේරා නොගත් උගස් ශේෂයක්ද, ඇතුලත් නොවේ.

## II (ආ) 14 වැනි සංඛ්‍යා සටහන

## 1974 වර්ෂය අවසානයට ග්‍රාමීය අංශයේ තැන්පතු සහ ණය දිස්ත්‍රික්ක අනුව දක්වීම

රුපියල් වලින්

| දිස්ත්‍රික්කය | | මුළු තැන්පතු* | මුළු ණය** | තැන්පතු හා ණය අතර වෙනස |
|---|---|---|---|---|
| කොළඹ | .. | 14,211,257 | 15,230,247 | — 1,018,990 |
| කළුතර | .. | 3,377,711 | 5,187,561 | — 1,809,850 |
| නුවර | .. | 5,123,892 | 7,762,650 | — 2,638,758 |
| මාතලේ | .. | 1,658,680 | 5,654,841 | — 3,996,161 |
| නුවරඑළිය | .. | 788,457 | 3,779,109 | — 2,990,652 |
| ගාල්ල | .. | 4,661,839 | 8,232,870 | — 3,571,031 |
| මාතර | .. | 1,922,510 | 5,870,397 | — 3,947,887 |
| හම්බන්තොට | .. | 2,290,547 | 16,233,793 | —13,942,746 |
| යාපනය | .. | 2,934,035 | 30,675,264 | —27,741,229 |
| මන්නාරම | .. | 213,581 | 12,579,347 | —12,365,766 |
| වවුනියාව | .. | 551,545 | 18,413,760 | —17,862,215 |
| මඩකලපුව | .. | 137,684 | 13,984,087 | —13,846,403 |
| අම්පාර | .. | 813,276 | 27,005,316 | —26,192,040 |
| ත්‍රිකුණාමලය | .. | 377,545 | 23,443,546 | —23,066,001 |
| කුරුණෑගල | .. | 10,370,956 | 16,710,207 | — 6,339,251 |
| පුත්තලම | .. | 2,784,807 | 9,138,547 | — 6,353,740 |
| අනුරාධපුරය | .. | 3,396,466 | 30,792,748 | —27,396,282 |
| පොළොන්නරුව | .. | 4,194,393 | 20,735,048 | —16,540,655 |
| බදුල්ල | .. | 4,245,141 | 11,004,023 | — 6,758,882 |
| මොනරාගල | .. | 466,558 | 4,592,303 | — 4,125,745 |
| රත්නපුරය | .. | 5,717,380 | 8,596,423 | — 2,879,043 |
| කෑගල්ල | .. | 2,983,405 | 4,425,941 | — 1,442,536 |
| එකතුව | .. | 73,221,665 | 300,047,528 | —226,825,863 |
| අඩුකළා - උකස් කිරීම | . | — | 38,398,508 | — |
| ශුද්ධ තත්ත්වය | .. | 73,221,665 | 261,649,020 | —188,427,355 |

මූලයන්: ලංකා බැංකුව
මහජන බැංකුව.

* රුපියල් 11,078, 066 ක ජංගම ගිණුම් තැන්පතු ඇතුළත් නොවේ.

** රුපියල් 329,673 අයිරා පහසුකම් අයත් නොවේ.

1974 දී ග්‍රාමීය අංශය වෙත බෙදහරින ලද මුළු ණය මුදලින් සියයට 80·1 ක් නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ දී ඇත. මුළු ණයෙන් විශාලතම අනුපාතයක් (එනම් සියයට 85·1 ක්) බෙද හැර ඇත්තේ, භෝග වගාව සඳහා බව නියමිත කාර්යයන් සඳහා දී ඇති ණය පිළිබඳ විග්‍රහයෙන් පෙනේ.

II (ආ) 14 වැනි සංඛ්‍යා සටහන අනුව සියලුම දිස්ත්‍රික්කයන්හි සෘණ තැන්පතු තත්ත්වයක් පෙන්නුම් කරයි. විශාලතම සෘණ ශුද්ධ තැන්පතු ප්‍රමාණය වාර්තා වී ඇත්තේ යාපනය දිස්ත්‍රික්කයෙන් ය.